| ශ්‍රේණිය<br>07 ශ්‍රේණිය | විෂය<br>චිත්‍රකලාව | වාරය<br>2 වාරය | 1.0 පාඩම/ඒකකය/ක්‍රියාකාරකම/ඇගයීම<br>පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි |
|---|---|---|---|

නිපුණතා මට්ටම 1.2 : ස්වාභාවික හා නිර්මිත පරිසරය ආශ්‍රිත චිත්‍ර සංරචනය කරයි

ක්‍රියාකාරකම 1.2.1 : ආගමික පරිසරය ඇසුරින් බැතිබර අවස්ථාවක් චිත්‍රණය කරමු

- ආගමික පරිසරය තේමා කොටගෙන විවිධ මාතෘකා ඔස්සේ මානව රූප හා ඒ හා සම්බන්ධ අනෙකුත් හැඩ සංරචනය කිරීම මේ පාඩමෙන් අධ්‍යයනය කරන්නට පුරුදු වෙමු.
- ආගමික පරිසරය යන තේමාව ඔස්සේ බෞද්ධ, හින්දු ,ඉස්ලාම්, කතෝලික ආදි ඕනෑම ආගමක් සම්බන්ධයෙන් චිත්‍රයක් සංරචනය කරන්නට ඔබට නිදහස තිබේ.
- මෙවැනි චිත්‍රයක් නිවැරදි ලෙස නිම කිරීමට මානව රූප මෙන්ම අනෙකුත් පරිසර අංග එනම් ( ගහකොළ ගොඩනැගිලි ආදිය ) ප්‍රගුණ කර තිබීම ඔබට වැදගත් වනු ඇත .
- මෙම තේමාව සඳහා විවිධ ක්‍රියාකාරකම් සිදුකරනු ලබන මානව ඉරියව් නිර්මාණය කිරීමට ඔබට සිදුවේ.
- ගැහැනු පිරිමි රූප ඒ ඒ වයස් මට්ටම් වලට අනුව නිර්මාණය කළ යුතුව ඇත.(බාල, තරුණ, මහලු ආදී ලෙස)
- මෙම තේමාවට අනුව චිත්‍ර සංරචනයක් සඳහා අදාළ කරගත හැකි මානව රූප හා ඒ හා සබැඳි අනෙකුත් අංග හොඳින් අධ්‍යයනය කරන්න.






13


25
26







| ශ්‍රේණිය | විෂය | වාරය | අභ්‍යාසය |
| --- | --- | --- | --- |
| 7ශ්‍රේණිය | චිත්‍ර කලාව | 2 වාරය | 1.0 පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි. |

නිපුණතා මට්ටම 1.2 : ස්වාභාවික හා නිර්මිත පරිසරය ආශ්‍රිත චිත්‍ර සංරචනය කරයි.

ක්‍රියාකාරකම 1.2.1 : ආගමික පරිසරය ඇසුරෙන් බැතිබර අවස්ථාවක් නිමවමු.

- දී ඇති පින්තූර හොඳින් නිරීක්ෂණය කරන්න.
- එහි දැකිය හැකි මිනිස් ඉරියව්වල ඇති ක්‍රියාශීලීය බව හොඳින් අධ්‍යයනය කරන්න.
- කිසි විටෙකත් මෙම පින්තූර කොපි නොකරන්න.ඔබට හැකි ආකාරයට ආගමික පරිසරය සම්බන්ධයෙන් ඔබේ මනසේ ඇඳුණු රූසටහන් සිතුවමට නැගීමට උත්සහ ගන්න.
- ඔබ දැක ඇති ආගමික ස්ථානයක කිසියම් ආගමික කටයුත්තක යෙදී සිටින බැතිමතුන් පිරිසකගේ හැසිරීම් වල ස්වභාවය ඔබගේ හැකියාව අනුව සිතුවමකට නැගීමට උත්සාහ ගන්න.
- එක් එක් මිනිස් ඉරියව් හා අවට පරිසරය උචිත ලෙස යෙදීමට මෙහිදී ඔබ වගබලා ගත යුතු බව සිත්හි තබාගන්න.
- වර්ණ කිරීම සඳහා සුදුසු වර්ණ මාධ්‍යයක් තෝරා ගන්න.(දියසායම්, පැස්ටල් හෝ වෙනත් මාධ්‍යයක් )
- වර්ණ යෙදීමේදී ආගමික පරිසරයක ඇති ශාන්ත,සංවර බව රැකෙන සේ වර්ණ ගන්වා ඔබගේ නිර්මාණය සාර්ථක කර ගැනීමට උත්සාහ ගන්න.

**සැ.යු.**

- **ඔබගේ නිර්මාණය සාර්ථක කරගන්නට පහත සිද්ධාන්ත භාවිතා කිරීම වාසි සහගත වනු ඇත.**

**පර්යාවලෝකය-ළඟ ඇති වස්තූන් වලට වඩා ඈත ඇති වස්තූන් කුඩාවට පෙනීම.**
**වර්ණ ශක්තීන් යෙදීම - තද වර්ණයේ සිට ලා වර්ණය දක්වා( අඳුරු එළිය සහ ත්‍රිමාණ බව)**